පරිසරය

# මුතුරාජවෙලට නව මුහුණුවරක්


මුතුරාජ නම් සෙනවියකු විසින් මෙම කෙත්යාය සංවර්ධනය කිරීම නිසා මුතුරාජවෙල යනුවෙන් නම් වූ බවක් ද මුතු වැනි වී කරල් පැහීම නිසා මුතුරාජවෙල යනුවෙන් භාවිතා වූ බවක් ද පුරාණ කතාවලින් කියෑ වේ.

මධ්‍යම පරිසර අධිකාරියේ ඒකාබද්ධ සම්පත් කළමනාකරණ වැඩසටහන මගින් මුතුරාජවෙල අභය භූමිය හා මීගමුව කලපුවේ සංරක්ෂණ කළමනාකරණය සඳහා වන වැඩසටහනේ තවත් අංගයක් ලෙස ජා ඇල වනසම්පත් හා පරිසර සුරැකීමේ බලකායේ සභාපති ජා-ඇල ප්‍රාදේශීය ලේකම් ඇම්.සී.ඇල්. ප්‍රනාන්දු මධ්‍යම පරිසර අධිකාරියේ ව්‍යාපාර කළමනාකරු අජිත් රුද්‍රිගු ප්‍රාදේශීය පරිසර බලධාරී ඇන්.එම්.ඒ.පී. පොන්සේකා හා පරිසර මැදුරේ කළමනාකාර සුමේධ දේවප්‍රිය යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් පාරිසරික සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය යෝජිත වැඩසටහන පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීමක් හා පාරිසරික චාරිකාවක් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහභාගිත්වයෙන් පමුණුගම පරිසර කේන්ද්‍රයේ දී පසුගියදා පැවැත්විණ.

මුතුරාජවෙල කැලණි ගඟේ පහළ කොටසක් මීගමු කලපුවත් අතර පවත්නා හෙක්ටයාර 3000 ක් පමණ වූ බිම් කොටසකි. සියවස් ගණනකට පෙර මේ රටට ම බත සපයා රට සහලින් ස්වයංපෝෂණය කළ මතරම් ගැඹුරු යායකි. මුතුරාජ නම් සෙනවියකු විසින් මෙම කෙත්යාය සංවර්ධනය කිරීම නිසා මුතුරාජවෙල යනුවෙන් නම් වූ බවක් ද මුතු වැනි වී කරල් පැහීම නිසා මුතුරාජවෙල යනුවෙන් භාවිතා වූ බවක් ද පුරාණ කතාවලින් කියෑ වේ.

කැලණි ගඟේ සිට මුතුරාජවෙලට ජලය සැපයූ කපාපු ඇල දඩුගම් ඔය නෙක් විහිදී ඇතත් අද වල් බිහි වී තිබේ. ජා-ඇලට වැටෙන තැන දෙපැත්තේ ම දෙරටු ඇදත් දක්නට හැකි ය. එතැන කුළු මෝදර යනුවෙන් හඳුන්වයි. සැලසුම්ගත වාරිමාර්ග ක්‍රමයක නටඹුන් පමණක් දක්නට තිබේ. 1505 සිට පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍යය යටත් විජිත පාලන කාලය තුළ විශේෂයෙන් කැලණි ගඟේ සිට පුත්තලමට ඉදිවූ පාරු ඇල මූදු සීමාව සමග කැපීම නිසා මුතුරාජවෙල කරදිය හා මිරිදිය එකතු වී කිවුල් දියක් බවට පත්වී මුලු මුතුරාජවෙලම ක්‍රම ක්‍රමයෙන් ගොවිතැනින් ඈත් විය. හොඳ මත්ස්‍ය සම්පතක් සිටීම නිසා විශාල පිරිසක් අදත් මේ ආශ්‍රිතව ජීවත් වෙති. එයට ද නරක කල දසාවක් ලබා ඇත්තේ ඒකල හා කටුනායක ප්‍රදේශවල කම්හල්වලින් හිඩි අඩියේ රාත්‍රියට ඇල මාර්ගවලට මුදා හරින විස සහිත අපවිත්‍ර ජලය නිසා ය.

වර්තමානයේ මුතුරාජවෙල පරිසර පද්ධතියට කොළඹ කටුනායක අධිවේගී මාර්ගය හේතුවෙන් බලවත් පරිසර ප්‍රශ්න ගණනාවක් පැන නගිනු ඇතැයි පරිසරවේදීහු බිය පළ කරති. තදබල ගංවතුරක් ඇතිවූදට වෙනද දඩුගම් ඔයෙන් හා ජා-ඇල පාලම්වල යටින් ගලා යන ජලකඳ මුළු ප්‍රදේශයක්ම සිසාරා බාධාවකින් තොරව ගලා බසිති. පිටුවට - 65



**මුතුරාජවෙල පරිසර සංරක්ෂණ ප්‍රදේශය මැදින් ඉදිවෙන කොළඹ කටුනායක අධිවේගී මාර්ගය**



**කඩොලාන ගසක මුල**



**මුතුරාජවෙල මැවෙන පරිසර සංරක්ෂණ කොටසට අයත් මීගමු කලපුවේ කඩින් කඩ පිහිටි වගුරු බිමක ඇදුම රෝගයට ප්‍රතිකාර සඳහා අවශ්‍ය කටු ඉකිලිය නමැති බෙහෙත් ගස් වර්ගය**

## මුතුරාජවෙලට...

28 පිටුවෙන්

ඉදිවෙන අධිවේගී මාර්ගය නිසා මේ ජලකඳ බැසයාම හිරවන විට වෙනද සුළු වශයෙන් යටවූ දඬුගම, තුඩැල්ල, දෙහියාගාත, අම්බලන්මුල්ල, සීදූව යන ගම්මානවලට භයානක තත්ත්වයක් ඇති විය හැකි බව ප්‍රදේශයේ පරිසර සංවිධාන කීපයක් විසින් ම පෙන්වා දී තිබේ.

බලයට පත්වූ හැම රජයක්ම වැඩිවන ජනගහනයට ඉඩම් ප්‍රශ්නය විසඳීම සඳහා කුඹුරු ඉඩම් කට්ටිකර ගොඩකිරීම හේතුවෙන් අනාගතය සඳහා වෙන්කර ඇති තෙත්බිම් විනාශවී යන අතර මේ සඳහා නිවන්දම, යක්කඩුව, මාකවිට, කොටුගොඩ, බටගම ආදී ප්‍රදේශශවල ගල්පඩි කඳු කපා ලවක් දෙවක් නැතිව ගොඩ කිරීමෙන් ද ඉහත සඳහන් ප්‍රදේශවල කඳු කැපීම නිසා කොස්, දෙල්, පොල්, අඹ වැනි විශාල වන ගහනයකට හානි සිදුවීම හේතුවෙන් ද එම ප්‍රදේශ මේ වන විට පානීය ජල හිඟයකට මුහුණ පා ඇත. පරිසර සංවිධාන මේ ගැන කොතෙක් හඬ නැගුවත් ඔවුන්ට විරුද්ධව දේශපාලකයින්ගේ පාතාලයන් නීතියෙන් බලය ලත් අයත් හරහට සිටිති.

නෙදර්ලන්ත ආධාර හා රජයේ ආධාරයක් ලැබෙන මෙම මුතුරාජවෙල පරිසර සංරක්ෂණ වැඩ පිළිවෙළ ව්‍යාප්ත කර සංචාරකයින් දැනුවත් කිරීමත් මුහුදු තීරයේ මෙයට ම සම්බන්ධ සංචාරක නිකේතනයක් නිර්මාණය කළහොත් කටුනායකින් මෙරටට එන සංචාරකයන් ප්‍රථමයෙන් ම මෙය නැරඹීමට එනු ඇතැයි සිතිය හැක. දැනට ලැබෙන ආදායමත් මෙය නඩත්තු කරන බවත් දැන ගන්නට තිබේ. පරිසර මැදුරට ද ස්ථිර නිවහනක් ලබා දී මීට වඩා ප්‍රචාරයක් දෙස් විදෙස්වලට දෙන්නේ නම් මුතුරාජවෙල පරිසර සංරක්ෂණ වැඩ පිළිවෙළින් රටේ සංචාරක කර්මාන්තයට නව මුහුණුවරක් දීමට හැකි වනු ඇත. ❑

**විස්තර හා ඡායාරූප**

**ඩබ්ලිව්. විල්ප්‍රඩ් සිල්වා**